# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2482/03 - 2026 මාර්තු මස 30 වැනි සඳුදා - 2026.03.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.-බී 7/2023

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත**

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය සහ 92 වන වගන්තිය සමඟ කියවිය යුතු 156 වන වගන්තිය යටතේ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විමසා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

හර්ෂණ නානායක්කාර,
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2026 මාර්තු මස 30 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

**1.** මේ නියෝග 2026 දූෂණ විරෝධී (මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය හරහා සිදු කරනු ලබන වත්කම් සහ බැරකම් ප්‍රකාශ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

**2.** පනතේ II වන කොටස අදාළ වන සෑම තැනැත්තකු ම,

(අ) පත් කළ දින සිට මාස තුනක් තුළ (පළමු පත්වීම් ප්‍රකාශය);

(ආ) පනතේ 82 වන වගන්තියේ (3) වන උපවගන්තිය ප්‍රකාරව වාර්ෂිකව (වාර්ෂික ප්‍රකාශය);

(ඇ) අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ රැකියාවේ නිල කාලය අවසන් වීමේ දී හෝ ඔහුගේ විශ්‍රාම දිනයෙන් හෝ ඔහු ධුරයෙන් ඉවත් කළ දිනයෙන් ඉක්බිතිව ම දින දහහතරක් තුළ (ධුර කාලය අවසානයේ දී හෝ විශ්‍රාම යාමේ දී සිදු කරනු ලබන ප්‍රකාශය);

(ඇ) (ඇ) ඡේදය යටතේ ප්‍රකාශය සිදු කළ වර්ෂයට අනුගාමී වර්ෂ දෙකක් තුළ (පශ්චාත් විශ්‍රාම ප්‍රකාශය);

(ඉ) රුපියල් මිලියන දහයක් හෝ රුපියල් මිලියන දහයකට වඩා වැඩි වත්කම් සහ බැරකම් පිළිබඳ වටිනාකමේ සුවිශේෂී වෙනස්කමක් සිදුවන අවස්ථාවක, ඒ සිදුවීමේ දින සිට මාසයක් ඇතුළත (තත්කාර්ය ප්‍රකාශය); සහ

(ඊ) අවස්ථාවෝචිත පරිදි, 1981 අංක 15 දරන ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳ පනත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත, 1988 අංක 2 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත හෝ (262 වන අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ, මැතිවරණ සඳහා නාම යෝජනා පත්‍ර ඉදිරිපත් කර ඇති විටදී,

https://www.ciaboc.gov.lk/ald යන වෙබ් සබැඳිය හරහා සපයා ඇති මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය මගින් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් වත්කම් සහ බැරකම් පිළිබඳව ප්‍රකාශ කරනු ලැබිය යුතු ය.

**3.** 2025 මාර්තු මස 20 වන දින අංක 2428/43 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද දූෂණ විරෝධී (වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශ) නියෝග, ඒ යටතේ නීත්‍යානුකූලව සිදු කරන ලද කිසිවකට අගතිරහිතව මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

**4.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියෝගයෙහි-

"පනත" යන්නෙන්, 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනත අදහස් වේ;

"වත්කම් සහ බැරකම්" යන්නට, https://www.ciaboc.gov.lk/ald යන වෙබ් සබැඳිය හරහා සපයා ඇති මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය මගින්, උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් ප්‍රකාශ කළ යුතු ශ්‍රී ලංකාව ඇතුළත හෝ පිටත, සෘජුව හෝ අර්ථලාභී ලෙස හිමි වත්කම්, බැරකම්, ආදායම්, වියදම් සහ පොලී මුදල් පිළිබඳ විස්තර ඇතුළත් වේ; සහ

"මධ්‍යගත ඉලෙක්ට්‍රොනික පද්ධතිය" යන්නෙන්, ඉලෙක්ට්‍රොනික ප්‍රකාශ ඉදිරිපත් කිරීම සහ සත්‍යායනය කිරීම සඳහා පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යනු ලබන ඉලෙක්ට්‍රොනික දත්ත සමුදාය අදහස් වේ.

**උපලේඛනය**

**(2 වන නියෝගය)**

**වත්කම් සහ බැරකම් ප්‍රකාශය**

**1.** 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 82 වන වගන්තිය යටතේ වත්කම් සහ බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම

**මෙතැනින් ආරම්භ කරන්න**

කරුණාකර, ඉදිරියට යැමට පෙර, උචිත ප්‍රකාශ වර්ගය තෝරා, ඔබේ ආයතනයේ සහ නිල නාමයෙහි විස්තර ඇතුළත් කරන්න. ඔබ විසින් සපයන තොරතුරු නිවැරදි වන බව සහ ප්‍රකාශය සිදු කරන දිනට ඔබගේ නිල නාමය නිරූපණය වන බව තහවුරු විය යුතු ය. ඔබගේ නිල නාමය ලැයිස්තුවේ සඳහන් නොවේ නම්, සහ ඔබ විසින් 2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 80 වන වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති පන්ති හෝ විස්තරය යටතේ වන නිල නාමයක් දරන්නේ නම්, ඔබ විසින් “වෙනත්” යන්න තෝරා, අදාළ නිල නාමය, අතින් ඇතුළත් කළ යුතු ය.

ප්‍රකාශයේ වර්ගය :

ප්‍රකාශයේ වර්ෂය :

පන්තිය හෝ විස්තරය :

ආයතනය :

නිල නාමය :

කාර්යාලීය ලිපිනය :

කාර්යාලීය දුරකතන අංකය :

නිල සන්නිවේදනය සඳහා ඔබ කැමති භාෂාව කුමක්ද? :

**2.** ප්‍රකාශකගේ ජීව දත්ත

<u>පුද්ගලික තොරතුරු</u>

සම්පූර්ණ නම :

මුලකුරු සමඟ නම :

මුලකුරු සමඟ නම ඉංග්‍රීසියෙන් (තොරතුරු ඇතුළත් කරන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් නම් පමණි) :

උපන් දිනය :

ජාතිකත්වය :

ජාතික හැඳුනුම්පත් අංකය (එන්අයිසී) :

විදේශ ගමන් බලපත්‍ර අංකය :

බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (ටීඅයිඑන්) :

ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් අංකය (එස්එල්යූඩීඅයි) :

පුද්ගලික ජංගම දුරකතන අංකය :

ස්ථාවර දුරකතන අංකය :

පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය :

<u>ස්ථිර ලිපිනය</u>

| | |
|---|---|
| රට | : |
| පළාත | : |
| දිස්ත්‍රික්කය | : |
| නගරය | : |
| තැපැල් කේතය | : |
| වීථියේ නම | : |
| නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම | : |
| ඒකක අංකය හෝ නිවාස අංකය | : |

<u>වර්තමාන ලිපිනය</u>

| | |
|---|---|
| රට | : |
| පළාත | : |
| දිස්ත්‍රික්කය | : |
| නගරය | : |
| තැපැල් කේතය | : |
| වීථියේ නම | : |
| නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම | : |
| ඒකක අංකය හෝ නිවාස අංකය | : |

<u>ප්‍රකාශකගේ රැකියාව පිළිබඳ තොරතුරු</u>

| | |
|---|---|
| සේවා ස්ථානය හෝ අනුයුක්ත කර ඇති ආයතනය | : |
| නිල නාමය | : |
| කාර්යාලීය දුරකතන අංකය | : |
| කාර්යාලීය ලිපිනය | : |

<u>විදේශ රටවල නේවාසික අයිතිවාසිකම්</u>

ඔබ යම් විදේශ රටක පුරවැසිභාවය, ස්ථිර පදිංචිය හෝ දිගු කාලීන වීසා (වසර දෙකකට වඩා වැඩි කාලයකට වලංගු වන) දරන්නේ ද?

| | |
|---|---|
| රට | : |
| නේවාසික තත්ත්වය | : |

**3. ප්‍රකාශක හැර ඇතුළත් කළ යුතු අනෙකුත් පුද්ගලයන්**

**2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 81 වන වගන්තිය යටතේ මාගේ ප්‍රකාශයේ මා විසින් ඇතුළත් කළ යුත්තේ කවුරුන් ද?**

පහත කාණ්ඩවල තැනැත්තන්ගේ (මෙහි මින් මතු “ ආවරණය වන තැනැත්තා” යනුවෙන් හඳුන්වනු ලබන) වත්කම් සහ බැරකම්:-

- ප්‍රකාශකගේ කලත්‍රයාගේ;
- වයස නොසලකා, ප්‍රකාශකගෙන් යැපෙන එක් එක් දරුවන්ගේ;
- වයස නොසලකා, ප්‍රකාශකගෙන් යැපෙන වෙනත් තැනැත්තන්ගේ; සහ
- යම් තැනැත්තකු ප්‍රකාශක සමඟ අන්‍යෝන්‍ය අයිතිවාසිකම් සහ බැඳීම් හුවමාරු කර නොගන්නා අවස්ථාවක දී හැර, ප්‍රකාශයේ දිනයට අවම වශයෙන් මාස හයකටවත් පෙරාතුව ප්‍රකාශක සමඟ අඛණ්ඩ කාලයක් පොදු නිවසක සහවාසයෙන් ජීවත් වන යම් තැනැත්තන්ගේ;

**ඔබට මෙම ප්‍රකාශයට ඇතුළත් කළ යුතු යම් ආවරණය වන තැනැත්තකු සිටී ද?**

**ඔබට ඔබගේ ආවරණය වන තැනැත්තකු ඇතුලත් කිරීමට අවශ්‍ය වන්නේ කුමන ආකාරයට ද?**

ආවරණය වන තැනැත්තකුගේ තොරතුරු අතින් ඇතුලත් කිරීම.
ආවරණය වන තැනැත්තකුගේ තොරතුරු මෙම පද්ධතියේ වෙනත් ප්‍රකාශයකින් ලබාගැනීම.

**<u>ආවරණය වන තැනැත්තකුගේ පුද්ගලික තොරතුරු</u>**

ප්‍රකාශකට ඇති සම්බන්ධතාව :
සම්පූර්ණ නම :
මුලකුරු සමග නම :
මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් (තොරතුරු ඇතුළත් කරන්නේ සිංහල හෝ දෙමළ මාධ්‍යයෙන් නම් පමණක්) :
උපන් දිනය :
ජාතිකත්වය :
ජාතික හැඳුනුම්පත් අංකය (එන්අයිසී) :
විදේශ ගමන් බලපත්‍ර අංකය :
බදු ගෙවන්නා හඳුනා ගැනීමේ අංකය (ටීඅයිඑන්) :
ශ්‍රී ලංකා අනන්‍ය ඩිජිටල් හැඳුනුම්පත් අංකය (එස්එල්යූඩීඅයි) :
පුද්ගලික ජංගම දුරකතන අංකය :
ස්ථාවර දුරකතන අංකය :
පුද්ගලික විද්‍යුත් තැපැල් ලිපිනය :

**<u>ස්ථිර ලිපිනය</u>**

රට :
පළාත :
දිස්ත්‍රික්කය :
නගරය :
තැපැල් කේතය :
වීථියේ නම :
නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම :
ඒකක අංකය හෝ නිවාස අංකය :

**<u>වර්තමාන ලිපිනය</u>**

රට :
පළාත :
දිස්ත්‍රික්කය :
නගරය :
තැපැල් කේතය :
වීථියේ නම :
නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම :
ඒකක අංකය හෝ නිවාස අංකය :

<u>විදේශ රටවල නේවාසික අයිතිවාසිකම්</u>

මෙම ආවරණය වන තැනැත්තා විදේශ රටක පුරවැසිභාවය, ස්ථිර පදිංචිය හෝ දිගු කාලීන වීසා (වසර දෙකකට වඩා වැඩි කාලයකට වලංගු වන) දරන්නේ ද?

රට :

නේවාසික තත්ත්වය :

**4.** ආදායම

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ප්‍රකාශයට අදාළ වන කාලසීමාව තුළ ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් උපයා ඇති සම්පූර්ණ දළ ආදායම සාමාන්‍යයෙන් ආදායම් වර්ගවලට පහත දේ ඇතුළත් වේ:-

- රැකියාවෙන් ලැබෙන නිත්‍ය ආදායම: ඔබගේ ප්‍රධාන සහ ද්වීතියික (ඇත්නම්) රැකියාවලින් ඉපයූ මුළු ආදායම;
- වෘත්තීයමය සේවාවලින් හෝ ව්‍යාපාරවලින් ලැබෙන ආදායම;
- නිවසකින් හෝ සාප්පුවකින් හෝ වෙනත් දේපළකින් හෝ වත්කම්වලින් ලැබෙන කුලී ආදායම;
- ස්ථාවර තැන්පතු හෝ ඉතුරුම් ගිණුම් මත උපයනු ලබන පොළිය;
- කොටස් හෝ ඒකක භාර හෝ වෙනත් ආකාරයෙන් වූ ආයෝජනවල ලාභාංශය;
- ලොතරැයි හෝ වෙනත් ඒ හා සමාන ක්‍රියාකරකම්වලින් ලැබෙන ආදායම;
- ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ ලද ත්‍යාග, පරිත්‍යාග හෝ උරුමයන්.

එම ආදායම ශ්‍රී ලංකාවෙන් පිටත ඇති ප්‍රභවයකින් ලැබුව ද එම ආදායම ශ්‍රී ලංකාවෙන් පිටත තබා තිබුණ ද ඔබ විසින් මෙම ආදායම ප්‍රකාශ කළ යුතු ය.

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ ලද නිත්‍ය ආදායම්</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු, විසින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ යම් නිත්‍ය ආදායමක් ලැබුවේ ද?

**ආදායම 1**

ආදායම ලබන තැනැත්තා :

නිත්‍ය ආදායම් වර්ගය :

ප්‍රභවය (ආදායම ලැබුණේ කාගෙන් ද?) :

ව්‍යවහාර මුදල් වර්ගය :

මුළු ආදායම් මුදල (අදාළ නම්, දීමනා සමඟ) :

අමතර තොරතුරු තිබේ නම් :

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ ලද වෙනත් ආදායම්</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ වෙනත් ආදායමක් ලැබුවේ ද?

**ආදායම 1**

ආදායම ලබන තැනැත්තා :

වෙනත් ආදායම් වර්ගය :

ප්‍රභවය (ආදායම ලැබුණේ කාගෙන් ද?) :

ව්‍යවහාර මුදල් වර්ගය :

මුළු මුදල (අදාළ නම්, දීමනා සමඟ) :

අමතර තොරතුරු තිබේ නම් :

**5. නිශ්චල දේපළ**

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ඇති ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් අයිතිය හෝ සන්තකය දරන (ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී නොමැති) සියලු නිශ්චල දේපළ සහ ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් අර්ථලාභී ලෙස දරා සිටින සියලු නිශ්චල දේපළ. එවැනි නිශ්චල දේපළවලට සාමාන්‍යයෙන්:-

- **ඉඩම්** - නේවාසික, කෘෂිකාර්මික (වී සහ වැවිලි භෝග ඇතුළුව), වාණිජ, කාර්මික, මුඩු හෝ සංවර්ධනය නොකළ ඉඩම්.
- **ගොඩනැගිලි සහ ව්‍යුහ** - නිවාස, නිවාස සංකීර්ණ, සහාධිපත්‍ය, සාප්පු, කාර්යාල, ගබඩා, කර්මාන්තශාලා හෝ ඉඩමේ ඇති ඕනෑම ස්ථිර ව්‍යුහයක්.
- **හවුල් අයිතිය ඇති දේපළක්** - කලත්‍රයා හෝ තෙවන පාර්ශ්වකරුවකු ඇතුළුව වෙනත් තැනැත්තකු සමඟ හවුල් අයිතිය ඇති දේපළවල ඔබගේ හිමිකමේ ප්‍රමාණයට.
- **අර්ථලාභී ලෙස හිමි දේපළ** - ඔබ විසින් පාලනය කරන හෝ අර්ථලාභ ලබන වෙනත් තැනැත්තකුට හිමි දේපළක්.
- **ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි දේපළ** - විදේශයක පිහිටි ඕනෑම ඉඩමක් හෝ ගොඩනැගිල්ලක්.

ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ.

**වැදගත්:** යම් දේපළක් භාවිත නොකළ ද, ආදායමක් ජනනය නොකළ ද, උකසට යටත්ව තිබුණ ද, නීතිමය ආරවුලකට සම්බන්ධව තිබුණ ද, එවැනි දේපළ ද ප්‍රකාශ කළ යුතු ය.

යම් දේපළක නීත්‍යනුකූල අයිතිය වෙනත් තැනැත්තකු විසින් දරනු ලැබුව ද, ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් එම දේපළෙහි ආර්ථික හෝ පාලන අයිතිය භුක්ති විඳින අවස්ථා අර්ථලාභී අයිතිය හෝ අර්ථලාභවලට ඇතුළත් වේ. උදාහරණ සඳහා -

- දේපළෙහි කුලී ආදායම ලැබීම, ලාභ ලැබීම් හෝ එම දේපළ විකිණීමෙන් උත්පාදිත දේ,
- දේපළ පරිහරණය කිරීමට හෝ දේපළ භාවිත කිරීමට අයිතිය තිබීම, (එහි වාසය කිරීම, ව්‍යාපාරික හෝ වාණිජ භාවිතය)
- දේපළ බද්ද, එහි කුලිය හෝ කළමනාකරණය වැනි දේපළ පිළිබඳ තීරණ පාලනය කිරීම,
- භාර, නාමිකයන්, ඥාතීන් හෝ අවිධිමත් වැඩපිළිවෙළක් හරහා වක්‍රව දරන අයිතීන්,
- අයිතිය වෙනත් තැනැත්තකුගේ නමින් තිබිය දී දේපළට මුදල් යෙදවීම හෝ දායක වීම.

ඇතුළත් වේ.

ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දේපළේ අර්ථලාභ භුක්ති විඳීම හෝ දේපළ පාලනය කිරීම සිදු කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොමැති වුවත් අර්ථලාභී හිමිකම හෝ අර්ථලාභය පවතී.

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් අයිතිය හෝ සන්තකය දරන නිශ්චල දේපළ</u>

ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් අයිතිය හෝ සන්තකය දරන (සමහිමිකම් ඇතුළුව) යම් නිශ්චල දේපළක් ඔබට ප්‍රකාශය කිරීමට තිබේ ද?

**නිශ්චල දේපළ 1**

අයිතිය හෝ සන්තකය දරන්නා :

දේපළ වර්ගය :

මෙම දේපළ ලියාපදිංචි කර තිබේ ද? :

**දේපළෙහි ලිපිනය**

රට :
පළාත :
දිස්ත්‍රික්කය :
නගරය :
තැපැල් කේතය :
වීථියේ නම :
නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම හෝ ඉඩමේ නම :
ඒකක අංකය හෝ නිවාස අංකය හෝ වරිපනම් අංකය :
ගොඩනැගිල්ලේ භූමි ප්‍රමාණය :
ඉඩමේ විශාලත්වය :
ඔබ එම වත්කම අත්කර ගත්තේ කෙසේ ද? :
අත්කර ගත්තේ කාගෙන් ද? :
සමහිමිකරුවන් හෝ අයිතිය ඇති පුද්ගලයින් සිටිද? :
සමහිමිකරුගේ හෝ සමහිමිකරුවන්ගේ නම් :
ඔප්පුවේ දිනය :
ඔප්පු අංකය :
ඔප්පුවේ සඳහන් වටිනාකම :
නොතාරිස්ගේ නම :
අමතර තොරතුරු තිබේ නම් :

**ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට අර්ථලාභී හිමිකම් ඇති නිශ්චල දේපළ**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට හෝ ආස්තීත්වයකට හිමිකම ඇති දේපළක් පාලනය කිරීම හෝ එම දේපළේ අර්ථලාභ ලබා ගැනීම සිදු කරන්නේ ද?

**නිශ්චල දේපළ 1**

පාලනය කිරීම හෝ අර්ථලාභ ලබා ගැනීම සිදු කරන තැනැත්තා :
දේපළ වර්ගය :
දේපළෙහි අයිතිය දරන්නා :

**දේපළෙහි ලිපිනය**

රට :
**පළාත :**
**දිස්ත්‍රික්කය :**
**නගරය :**
**තැපැල් කේතය :**
**වීථියේ නම :**
**නිවාස සංකීර්ණයේ නම හෝ නිවසේ නම හෝ ඉඩමේ නම :**
**ඒකක අංකය හෝ නිවාස අංකය හෝ වරිපනම් අංකය :**
**ගොඩනැගිල්ලේ භූමි ප්‍රමාණය :**
**ඉඩමේ විශාලත්වය :**
**පාලනය කිරීමෙහි හෝ අර්ථලාභ ලැබීමේ ස්වභාවය :**
**පාලනය කිරීම හෝ අර්ථලාභ ලබා ගැනීම සිදු කරන්නේ කුමන පදනමක් මත ද?**
**අමතර තොරතුරු තිබේ නම් :**

**6.** වාහන

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ඇති ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් හිමිකාරිත්වය හෝ සන්තකය දරන හෝ අර්ථලාභී ලෙස දරා සිටින (ලියාපදිංචි කළ හෝ ලියාපදිංචි නොකළ) සියලු ම වර්ගවල වාහන. එවැනි වාහන සඳහා සාමාන්‍යයෙන්,

- (203 වන අධිකාරය වූ) මෝටර් රථ පනත හෝ (202 අධිකාරය වූ) වාහන ආඥා පනත ප්‍රකාරව පුද්ගලික හෝ වාණිජමය භාවිතයට අරමුණු කරන වාහන
- ජලයේ ගමන් කරන සියලු වාහන වර්ග
- ක්‍රීඩා සහ ක්‍රීඩා ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා භාවිත කරන වාහන
- (මගීන් හෝ භාණ්ඩ) ගුවනින් ප්‍රවාහනය කිරීම සඳහා භාවිත කරන වාහන

ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ.

**වැදගත්:** වාහනයක් භාවිත නොකළ ද, ආදායමක් ජනනය නොකළ ද, උකසට යටත්ව තිබුණ ද, නීතිමය ආරාවුලකට සම්බන්ධව තිබුණ ද, එවැනි වාහනයක් ප්‍රකාශ කළ යුතු ය.

වාහනයක නීත්‍යානුකූල අයිතිය වෙනත් තැනැත්තකු විසින් දරනු ලැබුව ද, ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් එම වාහනයේ යම් ආර්ථික හෝ පාලන අයිතිය භුක්ති විඳින අවස්ථා අර්ථලාභී හිමිකමට හෝ අර්ථලාභවලට ඇතුළත් වේ. උදාහරණ සඳහා,

- එම වාහනයෙහි කුලී ආදායම ලැබීම, ලාභ ලැබීම හෝ විකිණීමෙන් ලැබෙන උත්පාදිත දේ
- එම වාහනය පරිහරණය කිරීමට හෝ භාවිත කිරීමට අයිතිය තිබීම (ව්‍යාපාරික හෝ වාණිජ භාවිතයන් සඳහා)
- වාහන කුලිය හෝ කළමනාකරණය වැනි එම වාහනය පිළිබඳ තීරණ පාලනය කිරීම
- භාර, නාමිකයන්, ඥාතීන් හෝ අවිධිමත් වැඩපිළිවෙළක් හරහා වක්‍රව අයිතිවාසිකම් දැරීම
- අයිතිය වෙනත් තැනැත්තකුගේ නමින් තිබිය දී එම වාහනයට මුදල් යෙදවීම හෝ දායක වීම,

ඇතුළත් වේ.

ඔබ විසින් හෝ ආවරණය වන තැනැත්තකු විසින් වාහනයේ අර්ථලාභ භුක්ති විඳීම හෝ වාහනය පාලනය කිරීම සිදු කරන්නේ නම් ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොමැති වුවත්, අර්ථලාභී හිමිකම හෝ අර්ථලාභය පවතී.
**විශේෂ සටහන:** රජය විසින් අනුයුක්ත කර ඇති වාහන ඔබ විසින් ප්‍රකාශ කළ යුතු නොවේ.

<u>**ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් හිමිකාරිත්වය හෝ සන්තකය දරන වාහන**</u>

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකුට යම් වර්ගයක වාහනයක හිමිකාරීත්වය හෝ සන්තකය තිබේ ද?

**වාහනය 1**

| | |
|---|---|
| වාහනයේ හිමිකරු | : |
| වාහනයේ වර්ගය හෝ විස්තරය | : |
| පරම අයිතිකරුවකු සිටී නම්, පරම අයිතිකරුගේ නම සහ ලිපිනය | : |
| එම වාහනය ලියාපදිංචි කර තිබේ ද? නැද්ද? | : |
| ලියාපදිංචි අංකය | : |
| වාහනය ලියාපදිංචි කළ රට | : |
| චැසි අංකය හෝ වාහනය හඳුනා ගැනීමේ අංකය | : |
| වර්ගය | : |
| මාදිලිය | : |
| නිෂ්පාදිත වර්ෂය | : |
| අත්කර ගත් දිනය | : |
| අත්කර ගැනීමට වැය කළ මුදල | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

<u>ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට අර්ථලාභී හිමිකාරිත්වය ඇති වාහන</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට හෝ ආස්ථිත්වයකට හිමිකාරිත්වය ඇති වාහනයක් (රජයේ අනුයුක්ත කළ වාහන හැර) භාවිත කිරීම, පාලනය කිරීම හෝ වෙනත් ආකාරයක ප්‍රතිලාභ ලබා ගැනීම සිදු කරන්නේ ද?

**වාහනය 1**

| | |
|---|---|
| වාහනය භාවිත කරන, පාලනය කරවන හෝ එහි අර්ථලාභ ලබා ගන්නා තැනැත්තා | : |
| වාහනයේ වර්ගය හෝ විස්තරය | : |
| පරම අයිතිකරුවකු සිටී නම්, පරම අයිතිකරුගේ නම සහ ලිපිනය | : |
| වාහනය ලියාපදිංචි කර තිබේ ද, නැද්ද? | : |
| ලියාපදිංචි අංකය | : |
| වාහනය ලියාපදිංචි කරන ලද රට | : |
| වැසි අංකය හෝ වාහනය හඳුනා ගැනීමේ අංකය | : |
| වර්ගය | : |
| මාදිලිය | : |
| නිෂ්පාදිත වර්ෂය | : |
| වාහනයේ හිමිකරු | : |
| වාහන රක්ෂණ ඔප්පුව දරන තැනැත්තා | : |
| පාලනයෙහි හෝ ලැබෙන අර්ථලාභවල ස්වභාවය | : |
| පාලනය කිරීම හෝ අර්ථලාභ ලබා ගැනීම සිදු කරන්නේ කුමන පදනමක් මත ද | : |
| ඔබ වාහනය පාලනය කිරීම හෝ එහි අර්ථලාභ ලබා ගැනීම සිදු කරන්නේ කෙදිනක සිට ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

## 7. ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම්

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තිබුණ ද, ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකුට හිමි, සන්තකය දරන, හෝ අර්ථලාභී ලෙස දරා සිටින (ලියාපදිංචි කළ හෝ ලියාපදිංචි නොකළ) සියලු ම වර්ගවල ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම් (එක් ස්වර්ණාභරණයක සහ වෙනත් වටිනා වත්කමක හෝ ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම්වල එකතුවක වටිනාකම රුපියල් මිලියනය ඉක්මවන විට). සාමාන්‍යයෙන්, එවැනි වටිනා ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම්වලට,

- පැළඳිය හැකි ස්වර්ණාභරණ (රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් වටිනා ද්‍රව්‍ය), අත් ඔරලෝසු, ආදිය;
- ආයෝජන අරමුණු සඳහා නිපදවූ නිම නොකළ රන්, රිදී, ප්ලැටිනම් හෝ වෙනත් වටිනා ද්‍රව්‍ය;
- මැණික්, දියමන්ති සහ පොළවෙන් ලබා ගන්නා වෙනත් වටිනා ද්‍රව්‍ය (කපා ඔප දැමූ හෝ නොදැමූ);
- මුද්දර, කාසි වැනි එකතු කළ හැකි අයිතම;
- පෞරාණික භාණ්ඩ, කලා කෘති ආදිය

ඇතුළත් වන අතර ඒවාට පමණක් සීමා නොවේ.

**වැදගත්:** ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම් භාවිතයට නොගත්ත ද, ආදායමක් ජනනය නොකළ ද, උකසට යටත්ව තිබුණ ද, හෝ නීතිමය ආරාවුලකට සම්බන්ධව තිබුණ ද, එවැනි ස්වර්ණාභරණ සහ වෙනත් වටිනා වත්කම් ද ප්‍රකාශ කළ යුතු ය.

ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම් නීත්‍යානුකූල හිමිකම වෙනත් තැනැත්තකු විසින් දරනු ලැබුවේ වුව ද, ඔබ හෝ ආවරණය වන තැනැත්තකු විසින් ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ ආර්ථික හෝ පාලන අයිතිය භුක්ති විඳීම සිදු වන අවස්ථා අර්ථලාභී හිමිකමට හෝ අර්ථලාභවලට අතුළත් වේ. උදාහරණයක් සඳහා,

- ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් නිතර පළඳින හෝ ළඟ තබා ගෙන ඇති, එනමුත් ඥාතියෙකුගේ නමින් ලියාපදිංචි කළ හෝ මිල දී ගත් ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්.
- සමාගමක්, භාරයක් හෝ පවුලේ සාමාජිකයෙක් විසින් පුද්ගලික පරිහරණය සඳහා ලබා දුන් යම් ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්.
- ආරක්ෂාව සඳහා වෙනත් තැනැත්තකු විසින් තබා ගෙන සිටින, එනමුත් නියමාකාරයෙන් ඔබගේ බවට සලකනු ලබන ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්.
- ඔබගේ හෝ යම් ආවරණය වන තැනැත්තකුගේ මුදලින් අත්පත් කර ගත්, එනමුත් වෙනත් අයකුගේ නමින් වාර්තා කර තිබෙන ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්,

ඇතුළත් වේ.

ඔබ හෝ ආවරණය වන තැනැත්තකු විසින් මෙම ස්වර්ණාභරණ හෝ වටිනා වෙනත් වත්කමේ අර්ථලාභීත්වය ලැබීම හෝ පාලන කටයුතු සිදු කරන්නේ නම්, එවිට, ලිඛිත ගිවිසුමක් නොමැති වුව ද, එය අර්ථලාභී හිමිකම හෝ අර්ථලාභවලට අයත් වන්නේ ය.

<u>**ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් අයිතිය හෝ සන්තකය දරන ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්**</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් යම් ස්වර්ණාභරණයක හෝ වෙනත් වටිනා වත්කමක, හිමිකාරීත්වය හෝ සන්තකය දරන්නේ ද?

**ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම 1**

| | |
|---|---|
| අයිතිය හෝ සන්තකය දරන්නා | : |
| ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ වර්ගය හෝ කාණ්ඩය | : |
| ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ විස්තරය | : |
| සමහිමිකරුවන් හෝ අයිතිවාසිකම් ඇති අය සිටී ද? | : |
| සමහිමිකරුවන් හෝ අයිතිවාසිකම් ඇති අයගේ නම් | : |
| ස්වර්ණාභරණය හෝ වෙනත් වටිනා වත්කම අත්කර ගත්තේ කෙසේ ද? | : |
| ස්වර්ණාභරණය හෝ වෙනත් වටිනා වත්කම අත්කර ගත්තේ කවදා ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

<u>**ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට අර්ථලාභී හිමිකම ඇති ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම්**</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්කු හෝ අස්ථිත්වයන් සතු ස්වර්ණාභරණ හෝ වෙනත් වටිනා වත්කම් භාවිත කිරීම, පාලනය කිරීම හෝ වෙනත් ආකාරයකින් ව්‍යුත්පන්න වූ යම් අර්ථලාභයක් ලබා ගැනීම කරන්නේ ද?

**ස්වර්ණාභරණය හෝ වෙනත් වටිනා වත්කම් 1**

| | |
|---|---|
| භාවිත කිරීම, පාලනය කිරීම හෝ වෙනත් ආකාරයකින් ව්‍යුත්පන්න වූ අර්ථලාභ ලබා ගන්නා තැනැත්තා | : |
| ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ වර්ගය | : |
| ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ විස්තරය | : |
| ස්වර්ණාභරණයේ හෝ වෙනත් වටිනා වත්කමේ අයිතිකරුගේ නම | : |
| අර්ථලාභයේ ස්වභාවය | : |
| අර්ථලාභ ලැබුනේ කුමන පදනමක් මත ද? | : |
| ඔබ විසින් අර්ථලාභ ලබන්නේ කෙදිනක සිට ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**8. පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන අයිතිය වැනි වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම්**

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ස්පර්ශ කළ නොහැකි වත්කම් යටතට බුද්ධිමය දේපළ අයිතිය (නව නිපැයුම්, ප්‍රයෝජනවත් ආකෘති, දැනුම, කාර්මික සැලසුම් හෝ ශාක ප්‍රභේද, වෙළෙඳ ලකුණ හෝ වෙළෙඳ නාමය, ප්‍රකාශන අයිතිය, යනාදිය සඳහා ඇති අයිතිය), යටි පස සහ වෙනත් ස්වභාවික සම්පත් ප්‍රයෝජනයට ගැනීම සඳහා ඇති අයිතිය හෝ වෙනත් යමක් අයත් වේ (සඳහන් කරන්න).

ස්පර්ශ කළ නොහැකි වත්කමක නීත්‍යානුකූල අයිතිය වෙනත් තැනැත්තකු විසින් දරනු ලැබුව ද, ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් එම අස්පෘශ්‍ය වත්කමේ යම් ආර්ථික හෝ පාලන අයිතිය භුක්ති විඳීම සිදුකරන අවස්ථා අර්ථලාභී අයිතය හෝ අර්ථලාභවලට ඇතුළත් වේ.

**<u>ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට නෛතිකව හිමි හෝ නමට වාර්තා කොට තිබෙන (පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන අයිතිය වැනි) වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම්</u>**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකුට, නෛතික හිමිකම ඇති යම් වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කමක් තිබේ ද නැතහොත් ඔබගේ හෝ යම් ආවරණය වන තැනැත්තකුගේ නමට වාර්තා කොට තිබෙන එවැනි වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම් තිබේ ද?

**වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම 1**

| | |
|---|---|
| හිමිකාරිත්වය හෝ සන්තකය දරන්නා | : |
| එම වත්කමේ වර්ගය | : |
| එම වත්කම ලියාපදිංචි කර තිබේ ද? | : |
| එම වත්කම වාණිජකරණය කර ආදායම් උත්පාදනය වීම සිදු වන්නේ ද? | : |
| අත්කර ගත් දිනය | : |
| එම වත්කම අත්කර ගත් ආකාරය | : |
| සමහිමිකරුවන් හෝ අයිතිවාසිකම් ඇති අය සිටී ද? | : |
| සමහිමිකරුවන්ගේ හෝ වෙනත් අයිතිවාසිකම් ඇති අයගේ නම් | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**<u>ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට අර්ථලාභී අයිතිය ඇති (පේටන්ට් බලපත්‍ර, ප්‍රකාශන අයිතිය වැනි) වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම්</u>**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකුට හෝ ආස්ථිත්වයකට නෛතිකව හිමි, හෝ ඔවුන්ගේ නමට ලියාපදිංචි කර ඇති වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කමකින් අර්ථලාභ ලබා ගන්නේ ද?

**වාණිජකරණය කළ හැකි ස්පර්ශ කළ නොහැකි වත්කම 1**

| | |
|---|---|
| ආර්ථලාභ ලබා ගන්නා තැනැත්තා | : |
| එම වත්කමේ වර්ගය | : |
| එම වත්කම ලියාපදිංචි කර තිබේ ද? | : |
| එම වත්කම වාණිජකරණය කර ආදායම් උත්පාදනය කරන්නේ ද? | : |
| අර්ථලාභ ව්‍යුත්පන්න වන එම වත්කමේ නීත්‍යානුකූල හිමිකරුගේ නම හෝ එම වත්කම ලියාපංදිංචි කර තිබෙන්නේ යම් තැනැත්තකුගේ නමින් ද එම තැනැත්තාගේ නම | : |
| අර්ථලාභයේ ස්වභාවය | : |
| අර්ථලාභ ලබන්නේ කුමන පදනමක් මත ද? | : |
| අර්ථලාභ ලබන්නේ කෙදිනක සිට ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**9. මූල්‍ය වත්කම්**

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ඔබගේ නමින් හෝ යම් ආවරණය වන තැනැත්තකුගේ නමින්, ඇති සියලු මූල්‍ය වත්කම් හෝ එවැනි මූල්‍ය වත්කම්වල අර්ථලාභී හිමිකම් ලැබීම්, මෙම කාණ්ඩය යටතේ වන මූල්‍යමය වත්කම්වලට-

- **මුදල්:** ශ්‍රී ලංකා රුපියල් හෝ වෙනත් ව්‍යවහාර මුදල්වලින් අතැති මුදල් හෝ ආරක්ෂිත සේප්පුවල ඇති මුදල්.
- **තැන්පතු:** තැන්පතු වර්ගය නොසලකා (එනම්, ඉතුරුම්, ජංගම, කාලීන තැන්පතු ගිණුම් යනාදිය), ගිණුම්වල ඇති තැන්පතු.
- **විශ්‍රාම හෝ අර්ථසාධක අරමුදල්:** ඕනෑම අර්ථසාධක, විශ්‍රාම පාරිතෝෂිකයක් හෝ විශ්‍රාම ඉතුරුම් සැලසුම් ක්‍රමයක් (මධ්‍යම සේවක අර්ථසාධක අරමුදල (ඊපීඑෆ්), සේවා නියුක්තයන්ගේ භාර අරමුදල (ඊටීඑෆ්) හෝ ඔබගේ රැකියාව මත පදනම්ව ඇති අනිවාර්ය අර්ථසාධක අරමුදලක් හෝ විශ්‍රාම යෝජනා ක්‍රමයක් හැර) වාර්ෂික ගෙවනු ලබන මුදලක් හෝ විශ්‍රාම රක්ෂණ යෝජනා ක්‍රම යනාදිය.
- **ලබා දී ඇති ණය හෝ ලැබිය යුතු ණය:** (රුපියල් මිලියනයකට සහ ඊට වැඩි): ඔබ හෝ ආවරණය වන තැනැත්තකු, ප්‍රතිග්‍රාහකයා, ණයහිමියා හෝ ඍජුව හෝ වක්‍රව අර්ථලාභ ලබාගන්නේ නම්, පුද්ගලයින්ට ලබා දී ඇති පුද්ගල අත්තිකාරම් ණය, ලබා දී ඇති ව්‍යාපාර හෝ වාණිජ ණය, අයවීමට ඇති හිඟ මුදල්, පොරොන්දු නෝට්ටු හෝ ඒ හා සමාන නෛතික මූල්‍ය ලියවිලි යනාදිය,

ඇතුළත් වේ.

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු සතු අතැති මුදල්</u>

ඔබ සතුව හෝ යම් ආවරණය වන තැනැත්තකු සතුව යම් අතැති මුදලක් තිබේ ද?

**අතැති මුදල් 1**

| | |
|---|---|
| හිමිකාරිත්වය හෝ සන්තකය දරන්නා | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| ප්‍රකාශයේ දිනට ඇති ශේෂය | : |

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති ගිණුම් සහ තැන්පතු</u>

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකුහට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මකවන බැංකු හෝ මූල්‍ය ආයතනවල යම් ගිණුමක් හෝ තැන්පතුවක් තිබේ ද?

**ගිණුම හෝ තැන්පතුව 1**

| | |
|---|---|
| ගිණුමේ හෝ තැන්පතුවේ හිමිකරු | : |
| බැංකුව හෝ මූල්‍ය ආයතනය | : |
| ගිණුම් වර්ගය | : |
| ගිණුම් අංකය හෝ තැන්පතුවේ යොමු අංකය | : |
| මෙම ගිණුම හෝ තැන්පතුව හවුල් ගිණුමක් ද? හවුල් තැන්පතුවක් ද? | : |
| හවුල් ගිණුමේ හෝ හවුල් තැන්පතුවේ විස්තර | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| ප්‍රකාශයේ දිනට ඇති ශේෂය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන වෙනත් ආස්ථිත්වයන්හි (විදේශීය ආස්ථිත්ව ඇතුළුව) හෝ පුද්ගලයින් ළඟ තබා ඇති තැන්පතු**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් ආස්ථිත්වයන්හි (විදේශ ආස්ථිත්ව ඇතුළුව) හෝ පුද්ගලයින් ළඟ තබා ඇති යම් තැන්පතුවක් දරන්නේ ද?

**තැන්පතුව 1**

| | |
|---|---|
| තැන්පතුවේ හිමිකරු | : |
| තැන්පතුව දරා සිටින ආස්ථිත්‍යය හෝ තැනැත්තා | : |
| තැන්පතුවේ ස්වභාවය | : |
| තැන්පතුවේ ගිණුම් අංකය හෝ තැන්පතුවේ යොමු අංකය | : |
| ඔබට සමහිමිකාරිත්වයක් තිබේ ද? | : |
| සමහිමිකාරිත්වයේ තොරතුරු | : |
| හිමිකාරිත්වයේ කොටස | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| ආරම්භ කළ දිනය | : |
| ප්‍රකාශයේ දිනට ඇති ශේෂය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන පරිගණක ආකෘතියකින් යුත් මුදල් සහ ඩිජිටල් ව්‍යවහාර මුදල්**

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකු හට යම් පරිගණක ආකෘතියකින් යුත් මුදල් හෝ ඩිජිටල් ව්‍යවහාර මුදල් තිබේ ද?

**පරිගණක ආකෘතියකින් යුත් මුදල් සහ ඩිජිටල් ව්‍යවහාර මුදල් 1**

| | |
|---|---|
| ව්‍යවහාර මුදල්වල හිමිකරු | : |
| පරිගණක ආකෘතියකින් යුත් මුදල් හෝ ඩිජිටල් මුදල් වර්ගය | : |
| එම ව්‍යවහාර මුදල තබා ඇති වොලට් ප්ලැට්ෆෝමය | : |
| එම ව්‍යවහාර මුදල් අත් කර ගත්තේ කෙසේ ද? | : |
| ප්‍රකාශයේ දිනට ඇති ප්‍රමාණය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දී ඇති ණය**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් පුද්ගලයකුට හෝ ආස්ථිත්වයකට යම් මුදලක් ණයක් ලෙස දී තිබේ ද?

**ණය 1**

| | |
|---|---|
| ණය ලබා දෙන ලද්දේ (ණයහිමියා) | : |
| ණය ලබා ඇත්තේ කා සඳහාද? (ණයගැතියා) | : |
| ලබා දෙන ලද ණය වෙනුවෙන් තැබූ සුරකුම | : |
| ණයට දෙන ලද මුදල | : |
| ණය මුදලේ පොලී ප්‍රතිශතය | : |
| ප්‍රකාශයේ දිනට ශේෂය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**10.** භාරය

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

- කිසියම් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් විසින්, ඔබ වෙනුවෙන් හෝ යම් ආවරණය වන තැනැත්තකු වෙනුවෙන් දරා සිටින දේපළ.
- ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් වෙනුවෙන් දරා සිටින දේපළ

එම දේපළවලට -

  - නිශ්චල දේපළ සහ චංචල වත්කම්
  - සමාගම් කොටස්, මුදල්, ස්පර්ශ කළ හැකි හෝ ඩිජිටල් ව්‍යවහාර මුදල් වැනි දෑ,

ඇතුළත් වේ.

**<u>යම් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් විසින්, ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු වෙනුවෙන් දේපළක් ලෙස, භාරයක් දැරීම</u>**

කිසියම් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් විසින්, ඔබ වෙනුවෙන් හෝ යම් ආවරණය වන තැනැත්තකු වෙනුවෙන්, යම් දේපළක් භාරයක් ලෙස දරයි ද?

**භාරයක් ලෙස දරන දේපළ 1**

| | |
|---|---|
| දේපළ, භාරය ලෙස දරන්නේ කවුරුන් වෙනුවෙන් ද? | : |
| භාරය ලෙස දරා සිටින්නේ කුමන දේපළක් ද? | : |
| දේපළ පිළිබඳ විස්තර | : |
| දේපළ භාරය ලෙස තබන ලද දිනය | : |
| දේපළ දරා සිටින පුද්ගලයා හෝ ආස්ථිත්වය | : |
| දේපළෙහි අර්ථලාභය ලබන්නේ කවුරුන් ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් වෙනුවෙන් දේපළ භාරයක් ලෙස දැරීම</u>**

ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් යම් තැනැත්තකු හෝ ආස්ථිත්වයක් වෙනුවෙන් යම් දේපළක්, භාරයක් ලෙස දරයි ද?

**භාරයක් ලෙස දරන දේපළ 1**

| | |
|---|---|
| දේපළ, භාරය ලෙස දරා සිටින තැනැත්තා | : |
| භාරය ලෙස දරා සිටින්නේ කුමන දේපළක් ද? | : |
| එම දේපළ පිළිබඳ විස්තර | : |
| එම දේපළ භාරය ලෙස තබන ලද දිනය | : |
| එම දේපළ දරා සිටින්නේ කවුරුන් වෙනුවෙන් ද? | : |
| දේපළෙහි අර්ථලාභ ලබන්නේ කවුරුන් ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**11. මූල්‍යමය ආයෝජන වත්කම් සහ සාංගමික බැඳියාවන්**

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ඔබගේ හෝ යම් ආවරණය වන තැනැත්තකුගේ නමින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ දරන යම් මූල්‍යමය ආයෝජන වත්කමක් සහ සාංගමික බැඳියාවන්. මෙම කාණ්ඩයේ වත්කම් වර්ගවලට සාමාන්‍යයෙන් පහත කරුණු ඇතුළත් වේ:-

- **කොටස්:** රාජ්‍ය හෝ පුද්ගලික සමාගම්හි කොටස්, වරණීය කොටස්, ණයකර, ඍණ පත්‍ර, භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර, හුවමාරු වෙළඳ අරමුදල්, ඒකක භාර (ඊටීඵ්) සහ අන්‍යෝන්‍ය අරමුදල් ආදිය ඇතුළුව, එහෙත් ඒවාට සීමාව නොවී, ලැයිස්තුගත හෝ ලැයිස්තුගත නොකළ සියලු ව්‍යාපාර කොටස්වල අගය සහ ණය සුරැකුම්.
- **මූල්‍යමය වටිනාකමක් සහිත රක්ෂණ ඔප්පු:** ජීවිත රක්ෂණ ඔප්පු, දායාද ජීවිත ඔප්පු, ආයෝජන සම්බන්ධිත රක්ෂණ සැලසුම් ආදිය.
- **අධ්‍යක්ෂධුර සහ බැඳියාවන්:** ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු සාමාගමක හෝ ව්‍යාපාරයක අධ්‍යක්ෂවරයකු, හවුල්කරුවකු, භාරකරුවකු හෝ තනතුරු දරන්නකු වන්නේ නම්; හෝ
  ඔබ වෙත ඔබ වෙනුවෙන්, යම් ආවරණය වන තැනැත්තකු හෝ නම් කළ තැනැත්තකු, භාරකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තකු යම් සමාගමක බැඳියාවන් දරා සිටින්නේ නම් සහ ඔබගේ නම එම සමාගමේ නිල වාර්තාවල සඳහන් වී නැතත්, ඔබ හට මූල්‍යමය අර්ථලාභ ලැබෙන්නේ නම් හෝ එම සමාගමේ තීරණවලට ඔබට බලපෑම් කිරීමේ හැකියාවක් පවතීනම්; හෝ
  යම් ආවරණය වන තැනැත්තකු වෙනුවෙන්, නම් කළ තැනැත්තකු, භාරකරුවෙකු හෝ වෙනත් යම් තැනැත්තකු යම් සමාගමක බැඳියාවන් දරා සිටින්නේ නම් සහ එම ආවරණය වන තැනැත්තකුගේ නම එම සමාගමේ නිල වාර්තාවල සඳහන් වී නැතත් එම ආවරණය වන තැනැත්තකු හට මූල්‍යමය අර්ථලාභ ලැබෙන්නේ නම් හෝ එම සමාගමේ තීරණවලට එම ආවරණය වන තැනැත්තාට බලපෑම් කිරීමේ හැකියාවක් පවතීනම් -
    - සමාගම අක්‍රියව පැවතිය ද, ලාභ නොලැබුව ද,
    - අදාළ කාලසීමාව තුළ ඔබට කිසිදු ආදායමක් නොලැබුණ ද,
    - මූල්‍යමය ආයෝජන වත්කම් සහ සාංගමික බැඳියාවන් ශ්‍රී ලංකාවෙන් පිටත දැරුව ද,

ඔබ විසින් එම මූල්‍යමය ආයෝජන වත්කම් සහ සාංගමික බැඳියාවන් ප්‍රකාශ කළ යුතු ය.

තනිව හෝ සම හිමිකම් ලෙස දැරුව ද යම් අර්ථලාභයක් ලබන, හෝ යම් නෛතික හෝ අර්ථලාභී බැඳියාවක් ඇති, ශ්‍රී ලංකාව තුළ හෝ පිටත තිබෙන ඔබ විසින් හෝ ආවරණය වන තැනැත්තකු විසින් හිමිකම් දරන හෝ අර්ථලාභය දරන සියලු ආයෝජන වත්කම් සහ සාංගමික බැඳියාවන් මෙම ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු ය.

**<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරන ප්‍රසිද්ධියේ ලැයිස්තුගත ස්කන්ධ සහ කොටස්වල කර ඇති ආයෝජන (දේශීය හා විදේශීය)</u>**

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකුට ප්‍රසිද්ධියේ ලැයිස්තුගත ස්කන්ධ හෝ කොටස්වල කර ඇති ආයෝජන තිබේ ද?

**ප්‍රසිද්ධියේ ලැයිස්තුගත ස්කන්ධ සහ කොටස්වල කර ඇති ආයෝජන 1**

| | |
|---|---|
| ආයෝජක හෝ මිල දී ගත් තැනැත්තා | : |
| කොටස් හුවමාරුව | : |
| මධ්‍යම තැන්පතු පද්ධති (සීඩීඑස්) ගනුදෙනු ගිණුම් අංකය හෝ හඳුනා ගැනීමේ අංකය | : |
| ටිකර් සංකේතය | : |
| නිකුත් කරන්නා හෝ සමාගම | : |
| නිකුත් කරන්නාගේ රට | : |
| ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනා ගැනීමේ අංකය (අයිඑස්අයිඑන්) | : |
| ප්‍රකාශයේ දිනට ඇති කොටස් ගණන | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

<u>ප්‍රකාශකට හෝ යම් ආවරණය වන තැනැත්තකුට හිමිකම ඇති පුද්ගලික හෝ ලැයිස්තුගත නොකළ කොටස්වල කර ඇති ආයෝජන (දේශීය හෝ විදේශීය)</u>

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකුට පුද්ගලික හෝ ලැයිස්තුගත නොකළ කොටස්වල කළ ආයෝජන තිබේ ද?

**පුද්ගලික හෝ ලැයිස්තුගත නොකළ කොටස්වල කළ ආයෝජන 1**

ආයෝජක :
නිකුත් කරන්නා හෝ සමාගම :
නිකුත් කරන්නාගේ ව්‍යාපාර ලියාපදිංචි අංකය :
ප්‍රකාශයේ දිනට ඇති කොටස් ප්‍රතිශතය :
ආයෝජනය සිදු කළ වර්ෂය :
ආයෝජනයේ ස්වභාවය :
ආයෝජනය කළ මුදල :
අමතර තොරතුරු තිබේ නම් :

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් රක්ෂණ යෝජනා ක්‍රමයන්හි හෝ සැලසුම්වල කර ඇති ආයෝජන</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු රක්ෂණ යෝජනා ක්‍රමයන්හි හෝ සැලසුම්වල ආයෝජනය කර තිබේ ද?

**රක්ෂණ යෝජනා ක්‍රමයන්හි හෝ සැලසුම්වල ආයෝජන 1**

ඔප්පුව දරන්නා :
රක්ෂණ සමාගම හෝ නිකුත් කරන්නා :
ඔප්පු අංකය :
ඔප්පුවේ වර්ගය :
අර්ථලාභියා :
ආරම්භ කළ දිනය :
වාරික මුදල (වාර්ෂික) :
කල් පිරීමේ දී වටිනාකම :
කල් පිරෙන වර්ෂය :
අමතර තොරතුරු තිබේ නම් :

<u>ප්‍රකාශක හෝ ආවරණය වන තැනැත්තකු විසින් දරන වෙනත් යම් ආකාරයක කර ඇති ආයෝජන</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් වෙනත් යම් ආකාරයක ආයෝජන දරන්නේ ද?

**වෙනත් යම් ආකාරයක ආයෝජන 1**

ආයෝජක :
ආයෝජනය සිදු කළ වර්ෂය :
ආයෝජනයේ ආකාරය :
ආයෝජනය කළ මුදල :
අර්ථලාභියා :
අර්ථලාභ වටිනාකම :
අමතර තොරතුරු තිබේ නම් :

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරන සාංගමික බැඳියාවන්</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකුට හට සාංගමික බැඳියාවන් තිබේ ද?

**සාංගමික බැඳියාව 1**

| | |
|---|---|
| බැඳියාව ඇති තැනැත්තා | : |
| සමාගමේ හෝ ආස්ථිත්වයේ නම | : |
| ආස්ථිත්වයේ වර්ගය | : |
| ලියාපදිංචි අංකය | : |
| සාංගමික බැඳියාවේ ස්වභාවය හෝ දරන තනතුර | : |
| හිමිකම් ප්‍රතිශතය | : |
| කෙදිනක සිට ද? | |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**12. වියදම්**

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ඔබ විසින් හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශ රටක දී, ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ දී එක් එක් වියදම් කාණ්ඩය යටතේ දරන ලද එක් වියදමක හෝ වියදම්වල එකතුව රුපියල් මිලියනය සහ රුපියල් මිලියන දහය අතර වන සියලු ප්‍රධාන වියදම්.
(වියදම්හි වටිනාකම, රුපියල් මිලියන දහයක හෝ ඊට වැඩි සුවිශේෂී වෙනස්කමක් සිදු වී එම දිනයේ සිට මසක කාලයක් තුළ ඔබ විසින් තත්කාර්යය ප්‍රකාශයක් භාර දී තිබේනම්, එවැනි වියදම් මෙහි ඇතුළත් කිරීම අවශ්‍ය නොවේ. කෙසේ වුව ද, තත්කාර්යය ප්‍රකාශයක් මගින් එවැනි වියදමක් ප්‍රකාශ කර නොමැති නම්, එයට අදාළ විස්තර මෙහි සඳහන් කළ යුතු ය.)

එම වියදම් සඳහා,

- **අර්ථසාධක අරමුදල, රක්ෂණ ගෙවීම් (ජීවිත රක්ෂණ ඇතුළුව) හෝ විශ්‍රාම යෝජනා ක්‍රම සඳහා දායක මුදල් ගෙවීම.**
- **උත්සව වියදම්: මංගල්‍යයන්, අවමංගල්‍යයන්, හෝ වෙනත් සුවිශේෂී උත්සව.**
- **චාරිකා වියදම්:** දේශීය හෝ විදේශීය චාරිකා සඳහා උපචිත වූ වියදම්.
- **ආගමික ආයතන හෝ පුණ්‍යායතන හෝ වෙනත් ආකාරයේ ආයතන වෙත කළ පරිත්‍යාග**

**ඇතුළත් වේ.**

**වැදගත්:** නිතිපතා කරන බිල්පත් ගෙවීම් සහ දෛනික වියදම් ප්‍රකාශ කළ යුතු නැත.
**මෙම වියදම් ශ්‍රී ලංකාවෙන් පිටත දී උපචිත වුවද මෙම වියදම් ඔබ විසින් ප්‍රකාශ කළ යුතු ය.**

<u>ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ දී දරන ලද ප්‍රධාන වියදම් (වියදම් කාණ්ඩය යටතේ දරනු ලැබූ එක් වියදමක හෝ වියදම්වල එකතුව රුපියල් මිලියනයක් සහ රුපියල් මිලියන දහයක් අතර වන අවස්ථාවල)</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ප්‍රකාශයට අදාළ කාලසීමාව තුළ එක් එක් වියදම් කාණ්ඩය යටතේ එක් වියදමක හෝ වියදම්වල එකතුව රුපියල් මිලියනයක් සහ රුපියල් මිලියන දහයක් අතර වන යම් ප්‍රධාන වියදමක් දරා තිබේ ද?

**වියදම 1**

| | |
|---|---|
| වියදම දරන ලද තැනැත්තා | : |
| වියදම් කාණ්ඩය | : |
| විස්තරය | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| මුදල් ප්‍රමාණය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**13.** බැරකම්

**මා විසින් ප්‍රකාශ කළ යුත්තේ මොනවා ද?**

ප්‍රකාශයේ දිනට ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ආපසු ගෙවීමට නියමිත, ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ඇති යම් සුවිශේෂී මූල්‍යමය බැරකම්. මෙයට, විධිමත් ණය, අවිධිමත් ණය සහ වෙනත් නෛතික හෝ මූල්‍යමය බැඳීයාවන් ඇතුළත් වේ. ඔබගේ ප්‍රකාශයේ සාමාන්‍යයෙන් පහත සඳහන් දේ ඇතුළත් කළ යුතු ය:-

- **විධිමත් බැරකම්:** අනුමත හෝ පිළිගත් මූල්‍ය ආයතනවලින් ලබා ගත් බැංකු ණය (නිවාස, වාහන, පුද්ගලික හෝ අධ්‍යාපනික ණය), උකස්කර හෝ දේපළ ඇපයට තබා ගත් ණය, ණය කාඩ්පත්, අයිරා හෝ වෙනත් අනුමත ණය පහසුකම් වැනි ණය සහ පහසුකම්.
- **අවිධිමත් බැරකම්:** ඔබ විසින් පුද්ගලිකව වගකිව යුතු පවුලේ සාමාජිකයින් හෝ මිතුරන්ගෙන්, පුද්ගලයකුගෙන් ලබාගත් මුදල්, අවිධිමත් ව්‍යාපාර ණය, පුද්ගලයන්ගෙන් හෝ ආස්ථිත්වයන්ගෙන් ලබා ගත් ණය පහසුකම්.
- **වෙනත් බැරකම් (නෛතික හෝ විශේෂ බැඳීම්):** ඔබ විසින් පුද්ගලිකව වගකිව යුතු වෙනත් තැනැත්තකුගේ හෝ සමාගමක ණය සඳහා දී ඇති ඇපකර හෝ සුරැකුම්, අධිකරණය නියෝග කළ ගෙවීම් හෝ වන්දි, හිඟබදු හෝ ව්‍යවස්ථාපිත බදු මුදල්, ව්‍යාපාර හා සම්බන්ධ බැඳීම් වැනි ණය යටතට නොවැටෙන, නමුත් ඔබ විසින් නීත්‍යානුකූලව ගෙවීමට බැඳී සිටින මූල්‍යමය බැඳීම්.

**වැදගත්:** බැරකම් ආපසු ගෙවීම තවම ආරම්භ කර නැති වුව ද, බැරකම් දරන්නේ ශ්‍රී ලංකාවේ හෝ විදේශයක ද යන්න නොසලකා ඔබ විසින් එම බැරකම් ප්‍රකාශ කළ යුතු ය.

නිතිපතා කරන බිල්පත් ගෙවීම් සහ දෛනික වියදම් ප්‍රකාශයට පත් කළ යුතු නැත.

යම් බැරකමක් ප්‍රකාශ කළ යුතු ද, නැද්ද යන්න පිළිබඳව පැහැදිලි අදහසක් නොමැති නම්, එම බැරකම ඇතුළත් කර කෙටියෙන් විස්තරයක් සපයන්න.

<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකු සහ මූල්‍ය ආයතනවලින් ලබා ගත් ණය සහ මූල්‍ය පහසුකම්</u>

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන බැංකු සහ මූල්‍ය ආයතනවලින් යම් ණයක් හෝ මූල්‍ය පහසුකමක් ලබා ගෙන තිබේ ද?

**ණය සහ මූල්‍ය පහසුකම 1**

| | |
|---|---|
| ණයගැතියා | : |
| ණය හෝ පහසුකම් වර්ගය | : |
| ණය දීමනාකරුගේ නම | : |
| ප්‍රකාශයේ දිනට ගෙවීමට ඇති මුදල | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| තබන ලද සුරැකුම | : |
| පොලී ප්‍රතිශතය | |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් යම් පුද්ගලයකුගෙන් හෝ වෙනත් ආකාරයේ ණය දෙන්නන්ගෙන් (විදේශීය ණය දෙන්නන් ද ඇතුළුව) ලබා ගෙන ඇති ණය සහ මූල්‍ය පහසුකම්</u>**

ඔබ හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් යම් පුද්ගලයකුගෙන් හෝ වෙනත් ආකාරයේ ණය දෙන්නන්ගෙන් (විදේශීය ණය දෙන්නන් ද ඇතුළුව) ණය හෝ මූල්‍ය පහසුකම් ලබා ගෙන තිබේ ද?

**ණය හෝ මූල්‍ය පහසුකම 1**

| | |
|---|---|
| ණයගැතියා | : |
| ණය හෝ පහසුකම් වර්ගය | : |
| ණය දීමනාකරුගේ නම | : |
| ණය මුදල ගත් වර්ෂය | : |
| ණය මුදල | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| ගෙවීමට ඇති ඉතිරි මුදල | : |
| ණය වර්ගය | : |
| ඉතිරි මුදල ආපසු ගෙවිය යුතු ද? | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**<u>ප්‍රකාශක හෝ යම් ආවරණය වන තැනැත්තකු විසින් දරනු ලබන වෙනත් වර්ගවල බැරකම්</u>**

ඔබට හෝ යම් ආවරණය වන තැනැත්තකු හට වෙනත් වර්ගවල බැරකම් තිබේ ද?

**බැරකම 1**

| | |
|---|---|
| බැරකම ඇති තැනැත්තා | : |
| බැරකමේ වර්ගය | : |
| බැරකම පිළිබඳ විස්තරය | : |
| ගෙවිය යුතු දිනය | : |
| බැරකම් මුදල | : |
| ව්‍යවහාර මුදල් වර්ගය | : |
| අමතර තොරතුරු තිබේ නම් | : |

**දිවුරුම/ ප්‍රතිඥාව**

මෙහි මා විසින් සපයා ඇති පිළිතුරු සහ සිදු කර ඇති ප්‍රකාශ, සත්‍ය හා නිවැරදි බවත්, වෙනත් කිසිදු පාර්ශ්වයක බලපෑමකින් හෝ බල කිරීමකින් තොරව, මෙම වත්කම් සහ බැරකම් ප්‍රකාශ කිරීම, සත්‍යවාදී ලෙස සිදු කළ බවත්, ගෞරව බහුමානයෙන් යුක්තව, අවංකව සහ සත්‍ය ලෙසට ප්‍රකාශ කර ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි. ප්‍රකාශ නොකළ වත්කම් සහ/ හෝ සාවද්‍ය ප්‍රකාශ පිළිබඳව අනාවරණය වුවහොත්, එහි නෛතික ප්‍රතිවිපාක පිළිබඳ මම මැනවින් දැනුවත්ව සිටිමි.

□ **මම ඉහත සඳහන් දිවුරුම හෝ ප්‍රතිඥාව කියවා එය අවබෝධ කරගෙන ඇති බව මෙයින් ප්‍රකාශ කර සිටිමි.**

| **සම්පූර්ණ නම** | **දිනය** |
|---|---|
| | |

EOG 03 - 0220/1

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.